අඹගමුව ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 21 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූනි 18 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අඹගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මස්කෙළිය උප කාර්යාලයේ වාහනවලට ඉන්ධන ලබා ගැනීම සඳහා මස්කෙළිය සමුපකාර සමිතිය වෙත ගෙවා තිබුණු රු.125,000 ක අත්තිකාරම් මස්කෙළිය ප්‍රාදේශීය සභාවට පවරා නොදී සභාවේ පෙර ගෙවුම් සහ අත්තිකාරම් යටතේ පෙන්වා තිබුණි. | අත්තිකාරම් මුදල පවරා දීමට හෝ ආපසු අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේදි නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳූ පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ 02 ක වටිනාකම හා එම ගිණුම් ශේෂවලට | පාලන ගිණුම් කාලීනව සැසඳීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

අදාළ උපයෝගී ලේඛන අතර රු.11,908,150 ක වෙනසක් විය.

(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------- | ----------------------------- |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැති ශේෂය රු.65,871,368 ක් වූ අතර ඉන් රු.26,050,468 ක් වසර 01 ක කාලයක් ඉක්මවා තිබුණි. | හිඟය අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.92,685,808 ක් වූ අතර ඉන් රු.55,263,978 ක් වසරක කාලයක් ඉක්මවා තිබුණි. | ණයහිමියන් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම
---------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------- | --------------------------- |
| 2017 සහ ඊට පෙර වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු අවස්ථා 65 කට අදාළ කාර්මාන්ත ආධාර මුදල් රු.13,536,207 ක් සම්බන්ධ කිසිඳු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අය කර ගැනීමට හෝ ගිණුම් නිවැරදි කිරීමට හෝ කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

1.4 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි | | | |
| (i) | මු.රෙ. 571(2) | අවස්ථා 25 කදී තැන්පත් කර වසර 02 ඉක්මවූ රු.302,508 ක් වටිනා තැන්පතු නියාදනය කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ii) | මු.රෙ. 189 | 1988 සිට 2007 දක්වා කාල පරිච්ඡේදය තුළ අවස්ථා 21 කදී අගරු වී ඇති රු.118,659 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | අදාළ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛය | වරිපනම් බදු සඳහා දේපළ තක්සේරුව වසර 05 කට වරක් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතු වේ. | අවස්ථා කිපයකදී තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. 2020 අගෝස්තු මස දී සිදුකරන බව දැනුම්දී ඇත. |

1.5 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු බදු පනත | ඉකුත් වර්ෂවලදී හා සමාලෝචිත වර්ෂය තුළ අයකළ මුද්දර බදු එකතුව රු.2,254,962 ක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | ඉකුත් වර්ෂ තුළදී එකතුකළ රු.738,143 ක ජාතිය ගොඩනැගීමේ බදු මුදලක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,355,920 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 2,026,854 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට සහ ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 5,126,400 | 2,927,733 | 3,588,220 | 1,961,779 | ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. | 2,070,677 | 1,573,804 | 1,761,446 |
| කුලී | 15,020,000 | 1,747,100 | 1,617,631 | 1,384,345 | | 2,387,650 | 2,504,792 | 2,339,603 |
| බලපත්‍ර ගාස්තු | 10,701,000 | 1,996,798 | 1,996,798 | 182,421 | | 1,242,900 | 1,242,900 | 182,420 |
| වෙනත් ආදායම් | 79,805,000 | - | | - | | 7,228,663 | 7,539,978 | 15,595,406 |
| | 110,652,400 | 6,671,631 | 7,202,649 | 3,528,545 | | 12,929,890 | 12,861,474 | 19,878,875 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ගිනිගත්හේන කලාපයේ දේපළ 13 කින් හා නෝටන්බ්‍රිජ් කලාපයේ දේපළ 11 කින් වසර 10 ක සිට පිළිවෙළින් අයවිය යුතු රු.284,207 ක සහ රු.246,624 ක වරිපනම් අය කරගෙන නොතිබුණි. | වරිපනම් බදු අය කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ii) | 2008 සිට 2017 වර්ෂය දක්වා කාලයට අදාළ හිඟ ටෙන්ඩර් කඩ ගාස්තු රු.1,002,644 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ ටෙන්ඩර් ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උසාවි දඩ රු.2,052,283 ක් හා මුද්දර ගාස්තු රු.20,000,000 ක් අයවිය යුතුව තිබුණි. | මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කාර්තවයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව ප්‍රාදේශීය සභාව ප්‍රමාණවත්ව දැනුවත්වී නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුලදී ඒ සම්බන්ධයෙන් නිශ්චිත කාර්යයන් ඉටුකර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒ අනුව සැලසුම් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ආ) අතහැර දැමූ කර්තව්‍යයන්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා අනුමත අයවැය ලේඛනයේ රු.88,700,000 ක මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබුණු ප්‍රාග්ධන ව්‍යාපෘති 07 ක් 2019 දෙසැම්බර් 31 දින වන විට ආරම්භ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ii) | 2018 වර්ෂයේ පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන මඟින් අනුමත කරන ලද රු.729,014 ක ද්‍රව්‍ය බෙදාදීමේ ව්‍යාපෘති 19 ක් සඳහා මුදල් ප්‍රතිපූර්ණය වී ඇතත් 2019 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (iii) | ගම්පෙරළිය වැඩසටහන යටතේ රම්පාදෙණිය ගෙවල් 20 හරහා ගෝනාවල මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම සඳහා රු.2,000,000 ක ප්‍රතිපාදන මුදලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ඇස්තමේන්තු සකස් කර, සභාව වෙත ලබා දී තිබුණි. සභාව විසින් ගිවිසුම් අත්සන් කරන ලද ග්‍රාම සංවර්ධන සමිතිය අදාළ ඉදිකිරීම පැහැර හැර තිබීම හේතුවෙන් ප්‍රදේශයේ සංවර්ධනය වෙනුවෙන් වෙන්කළ රු.2,000,000 ක ප්‍රතිපාදන අහෝසි වී තිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු වළක්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2009 වර්ෂයේ සිට 2019 ජූලි දක්වා විවිධ පුද්ගලයන්ට සහ ආයතනවලට ගෙවන ලද රු.1,547,006 ක අත්තිකාරම් පියවා නොතිබුණි. | අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3.3. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තනතුරු 12 ක පුරප්පාඩු 17 ක් පිරවීම හා තනතුරු 02 ක අතිරික්ත 02 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනිමට හා අතිරික්ත විධිමත් කරගැනීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජල සේවා සැපයීමේ පුනරාවර්තන වියදම රු.3,485,994 ක් වූ නමුත් ආදායම රු.926,051 ක් වූයෙන් ජල සේවා සැපයීමේ පාඩුව රු.2,559,943 ක් විය. | හැකිතාක් දුරට පිරිවැය ආවරණය කර ගැනිමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | ස්ට්‍රැදන්වත්ත නැගෙනහිර කොටසට පානීය ජල සැපයුම් කර්මාන්තය සඳහා වර්ෂය තුළදී රු.1,167,614 ක මුදලක් ගෙවීම් කර තිබූ නමුත් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ වාර්තාවක් ලබාගෙන නොතිබුණි. ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය වෙතින් පසුව නිකුත් කළ තත්ත්ව පරික්ෂණ වාර්තාවට අනුව ජලයේ අඩංගු බැක්ටීරියා ප්‍රතිශතය ඉතා ඉහළ අගයක් ගන්නා බව අනාවරණය වී තිබුණි. | ජලය පවිත්‍රකරණයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් වාහන 04 ක් සහ යතුරු පැදි 02 ක් වසර 05 කට අධික කාලයක් ධාවනයෙන් ඉවත්කර තිබුණු අතර, ඒවා අළුත්වැඩියාකර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ තීරණ අනුව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 193 අනුව අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සිදු වී තිබෙන වෙනස්වීම් පිළිබඳව කරුණු පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |